**ඇල්පිටිය ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**

-----------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 නොවැම්බර් 11 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ඇල්පිටිය  ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු ලැබීම් රු.29,252 ක් වැඩියෙන් ගිණුම්ගත කිරීම නිසා ලැබිය යුතු වරිපනම් බදු ශේෂය එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයක සභාව සතු වාහන අනතුරක් වෙනුවෙන් වරදකරු වූ රියදුරාගෙන් අයවිය යුතු රු.97,412 ක වටිනාකම සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීමෙන් වර්ෂයේ ආදායම වැඩියෙන් දක්වා තිබුණි.

#### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.23,399,856 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාළ  ශේෂ සහ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂ අතර එකතුව රු.5,341,692 ක් වූ අසමානතා නිරීක්ෂණය විය.

#### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) වසර තුනකට අධික කාලයක සිට ලැබිය යුතුව තිබූ රු.208,280 ක් වූ බැකෝ යන්ත්‍ර කුලී ආදායම සමාලෝචිත වර්ෂයේදීත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන වනවිට සහා බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් ලැබිය යුතුව පැවති රු.15,298,351 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළදීත් අය කරගෙන නොතිබුණි. ඉන් රු.6,624,192 ක මුදලක් ඉකුත් වර්ෂයටත් පෙර සිට ලැබිය යුතුව තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ සහා බලප්‍රදේශයේ සිදුකළ සංවර්ධන ව්‍යාපෘති 08 ක් සහ ඉකුත් වර්ෂයටත් පෙර සිදුකල ව්‍යාපෘතියක් සඳහා ගෙවිය යුතුව පැවති රු.1,401,309 ක් වර්ෂය අවසාන වනවිටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

එකතු වටිනාකම රු.110,273,732 ක් වූ ස්ථාවර වත්කම් පිළිබඳ යාවත්කාලීන කරන ලද වත්කම් පන්ති අනුව පිළියෙල කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය ද, රු.684,000 ක් වූ ඉඩම් වන්දි සම්බන්ධයෙන් වන්දි ලැබූ ඉඩම, වන්දි ලැබූ ආයතනය පිළිබඳ විස්තර ද, එකතු වටිනාකම රු.928,068 ක් වූ ආයුර්වේද තොග හා ගබඩා තොග සම්බන්ධයෙන් උපලේඛන ද ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

### 1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

-----------------------------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති සහ රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

| | නීති, රීති රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි වර්ෂයකට වරක් හෝ පරීක්ෂා කර නොතිබුණි. |
| (ආ) | පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 චක්‍රලේඛය | සභාව සතු කඩ කාමර 55 ක් සහ පදික කුටි 30 ක් සඳහා බදු ගිවිසුම් අළුත් කරවා ගැනීමට කටයුතු කර නොතිබූ අතර, ඇතිකර ගත් ගිවිසුම් වසර 20 කටත් වඩා පැරණි විය. |
| (ඇ) | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ 2010 අගෝස්තු 17 දිනැති අංක පීඊ/02/01 දරන චක්‍රලේඛය | වීථි පහන් ලේඛනයක් නඩත්තු කර, නව වීථි පහන් සඳහා අනුමැතිය ලබා ගැනීම සිදුකර නොතිබුණෙන් වීථි පහන් නඩත්තු කිරීමට සභාව විසින් දැරූ රු.378,443 ක වියදම් ප්‍රතිපූර්ණය කර ගැනීමට නොහැකි වී තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.14,080,170 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.21,428,007 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.7,347,837 ක පසුබෑමක් පෙන්නුම් කෙරුණි.

### 2.2 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

-----------------------------------

ඉකුත් වර්ෂවල තත්ත්වය සමඟ සමාලෝචිත වර්ෂයේ තත්ත්වය සැසඳීමේ දී ජංගම හා ක්ෂණික අනුපාතයන්ගේ සතුටුදායක තත්ත්වයක් පෙන්නුම් කළද, ජංගම වත්කම්වල ඇති රු.15,298,351 ක ලැබිය යුතු ප්‍රාග්ධන මුදල් හා රු.23,651,170 ක හිඟ ණයගැති ශේෂ පැවැතීමෙන් අනුපාතයන් ප්‍රකාරව ද්‍රවශීලතා තත්ත්වය නොපවතින බැව් නිරීක්ෂණය විය.

### 2.3 ආදායම් පරිපාලනය

---------------------

#### 2.3.1 වරිපනම් හා බදු

----------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාළව අයකර ගත යුතුව තිබුණු එකතුව රු.12,693,379 ක් වූ වරිපනම් බදු මුදලින් සමාලෝචිත වර්ෂය තුළ අයකිරීම් සියයට 21 තරම් අවම අගයක් විය. එම හේතුව නිසා වර්ෂය ආරම්භයට රු.9,162,732 ක් වූ හිඟ වරිපනම් බදු ශේෂය වර්ෂය අවසාන වනවිට රු.10,048,619 ක් දක්වා වර්ධනය වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාළව අයකර ගතයුතු එකතුව රු.358,290 ක් වූ අක්කර බදු මුදලින් වර්ෂය තුළ රු.119,647 ක මුදලක් පමණක් අය කරගෙන තිබූ අතර, එය සියයට 33 ක් තරම් පහළ අගයක් විය.

#### 2.3.2 කඩ කුලී

---------

සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.1,255,893 ක් වූ හිඟ කඩ කුලී ශේෂය වර්ෂය අවසානයට රු.2,233,775 ක් දක්වා වර්ධනය වී තිබූ අතර, වර්ෂය තුළ රු.1,227,203 ක මුදලක් පමණක් අයකරගෙන තිබුණි. එය ලැබිය යුතු මුදලින් සියයට 35 තරම් සුළු ප්‍රතිශතයක් විය. ඒ අනුව සභාව විසින් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 159 (අ) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොමැති බව විගණනයට නිරීක්ෂණය විය.

**2.3.3** උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව පැවති උසාවි දඩ රු.2,435,400 ක් හා මුද්දර ගාස්තු රු.8,238,352 ක් අයකර ගැනීමට කිසිදු වැඩපිළිවෙලක් සභාව සතු නොවුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම් තුනක 2016 වසර පුරා පැවති ශේෂයන්හි සාමාන්‍යය රු.7,010,708 ක් වූ අතර, අතිරික්තව ඇති මුදල් ආයෝජනය කිරීමට කටයුතු නොකිරීම නිසා සභාවට උපයාගත හැකිව තිබූ පොලී ආදායමක් අහිමි වී තිබුණි.

(ආ) සභා බලප්‍රදේශයේ ඉඩම් වෙන්දේසිවල දී පොදු පහසුකම් සඳහා සභාවට ලැබුණු ඉඩම් කැබලි 08 ක් තක්සේරු කර වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබූ අතර, එම ඉඩම්වල අයිතිය භෞතිකව තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.2** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

සභාවේ ආදායම් පරීක්ෂකවරු තුන්දෙනෙකු සිටින නමුත්, උප කාර්යාල දෙකෙන් රැස්කළ මුළු ආදායම රු.416,756 ක් විය. ඔවුන්ගේ කාර්යය නිසි පරිදි ඉටු නොවීම නිසා වර්ෂය අවසානයට වූ හිඟ ආදායම රු.23,651,170 ක් විය.

**3.3** **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

----------------------------------

සභා බලප්‍රදේශයේ තෝරාගත් ප්‍රදේශවල එකතු වන කසළ සභා භූමියට රැගෙන විත් වෙන් කිරීමකට ලක් කර, ඉතිරි කසළ සභාව සතු ඉගල්කන්ද වත්ත නැමති භූමියකට බැහැර කර තිබුණි. පිළිසරු ව්‍යාපෘතිය යටතේ ලැබුණු රු.1,252,311 ක මුදලකින් රුපියල් ලක්ෂ 10 ක් වැයකර, කසළ බැහැර කරනු ලබන භූමියේ කසළ වෙන් කිරීමට ගොඩනැගිල්ලක් ඉදිකර තිබූ නමුත්, එය වසර 03 කටත් අධික කාලයක් කිසිදු ප්‍රයෝජනයකට ගැනීමකින් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි.

**3.4** **වත්කම් කළමනාකරණය**

----------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

**(අ)** **නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්**

----------------------------------------

සභාව සතු දැනට භාවිතයෙන් ඉවත් කර ඇති වාහන 03 ක් සම්බන්ධව 2015 ජූලි 10 දිනැති අංක PFD/ASD/02/veh.circular 2015 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ආ) පවරා නොගත් වත්කම්**

---------------------------

සභාව විසින් භාවිතා කරන වාහන 05 ක් සම්බන්ධව අයිතිය සභාව සතු නොවූ අතර, ඒවායේ අයිතිය සභාව වෙත පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

**4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

---------------------------------------

**4.1 අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයන් 08 ක රු.13,709,267 ක් වූ ඉතිරිවීම් ද, එක් වියදම් විෂයයක රු.775,896 ක අහිතකර විචලනයන් ද, ආදායම් විෂයයන් 04 ක රු.2,220,414 ක ළඟාකර නොගත් ඉලක්කගත ආදායම් ද පැවතීම නිසා අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**4.2 අභ්‍යන්තර විගණනය**

----------------------

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි විධිවිධාන හා පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01 /නා.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාර අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

----------------------------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

--------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර විගණන විමසුම් මඟින් සභාවේ අවධානයට යොමු කරන ලදී. පහත විස්තර දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

| | <u>පද්ධතිය</u> | | <u>පද්ධතියේ ප්‍රධාන අඩුපාඩු</u> |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | (i) | වත්කම් පන්ති අනුව වෙන් වෙන්ව විස්තර දැක්වෙන පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| | | (ii) | මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් ස්ථාවර වත්කම් ශේෂයට අදාළව භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | | (iii) | ඉඩම් වෙන්දේසිවලින් පොදු පහසුකම් සැපයීමට ලබා දුන් ඉඩම් සම්බන්ධයෙන් වටිනාකම තක්සේරු කර ලේඛනගත කර නොතිබුණි. |
| (ආ) | ආදායම් රැස්කිරීම | (i) | හිඟ ආදායම් අයකර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කර, ක්‍රියාත්මක කර නොතිබුණි. |
| | | (ii) | හිඟ ආදායම් පිළිබඳ කාල විශ්ලේෂණයක් පිළියෙල කර නොතිබුණි. |
| (ඇ) | සේවක මණ්ඩල කළමනාකරණය | (i) | ප්‍රාදේශීය සභාව සඳහා අනුමත ස්ථිර කාර්ය මණ්ඩලය ඉක්මවා යොදවා තිබූ අතිරික්ත කාර්ය මණ්ඩල විධිමත් කර ගැනීමටත්, පුරප්පාඩුව පැවති තනතුරු සඳහා බඳවා ගැනීමටත් කටයුතු කර නොතිබුණි. |
| | | (ii) | දීර්ඝ කාලයක සිට පැවත එන හිඟ සේවක ණය ශේෂය අයකර ගැනීමට වැඩපිළිවෙලක් සභාව සතුව නොමැති විය. |
| (ඈ) | ලේඛන නඩත්තු කිරීම | (i) | හානි පාඩු ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| | | (ii) | පවත්වාගෙන යනු ලබන ලේඛන මාණ්ඩලික නිලධාරියකුගේ අධීක්ෂණයට ලක් වී නොතිබුණි. |
| (ඉ) | වාහන පාලනය | (i) | වාහන 05 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | | (ii) | සභාව සතු වාහනවල ඉන්ධන පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. |
| | | (iii) | භාවිතයෙන් ඉවත් කළයුතු වාහන ඉවත් කිරීම සම්බන්ධව කටයුතු කර නොතිබුණි. |
| (ඊ) | අයවැය පාලනය | | අයවැය ඇස්තමේන්තු සහ තථ්‍ය අගයන් කෙරෙහි අවධානය යොමුකර අයවැය ලේඛනය සංශෝධනය කරගෙන නොතිබුණි. |